# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2311/36 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

### සිවිල් නඩු විධාන සංග්‍රහය

192 වන වගන්තිය යටතේ නිවේදනය

මුදල් නීති පනත (422 වන අධිකාරය) යටතේ පිහිටුවනු ලැබ ඇති මුදල් මණ්ඩලය වෙත 1990 අංක 06 දරන සිවිල් නඩු විධාන (සංශෝධන) පනතින් සංශෝධිත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 192 වන වගන්තිය යටතේ පවරනු ලැබ ඇති බලතල ප්‍රකාර, දැනට පවත්නා බැංකු පොලී අනුපාතික සැලකිල්ලට ගනිමින්, නෛතික පොලී අනුපාතිකය 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂයකට සියයට දහසයයි දශම නවයයි හතක් (16.97%) විය යුතු යයි මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ,**
මුදල් මණ්ඩලයේ සභාපති සහ අධිපති,
ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 22 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

EOG 12 - 0310


1A - G 38418 — 26 (2022/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.